# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 157/12 — 1975 අප්‍රේල් 02 වැනි බදාදා — 1975.04.02

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : එන්. 136/75.

ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති හා සේනාධිනායක ධුරීන, විලියම් ගොපල්ලව
උතුමාණන් වහන්සේ විසිනි

(මුද්‍රාව)

වි. ගොපල්ලව,

වින්සන්ට් විමලධර්ම කුලරත්න මහත්මයා වෙතය,
ශුභාශිංසන පෙරටුවයි :

මෙහි මින් මතු සඳහන් කාර්යයන් සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍ය බව මට පෙනී යන හෙයින් :

ජනාධිපති විලියම් ගොපල්ලව වන මම ඔබ විචක්ෂණ භාවය, සාමාර්ථ්‍යය හා විශ්වාසවත් භාවය කෙරෙහි ඉමහත් භක්තිය හා විශ්වාසය තබමින් (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව පූර්වෝක්ත වින්සන්ට් විමලධර්ම කුලරත්න වන ඔබ පහත දක්වෙන කරුණු, එනම් :—

(1) 1975 පෙබරවාරි මස 3 වන දින හෝ ඒ දිනයෙහි පමණ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපයෙහි විනය ඇණ හිටීමට තුඩු දුන් හේතුව හෝ හේතු සහ සිද්ධිය හෝ සිද්ධි සහ 1975 පෙබරවාරි මස 3 වන දින එකී මණ්ඩපයෙහි නව ගණිත ඩිප්ලෝමා පාඨමාලාවට සහභාගිවීමට පැමිණි ගුරුවරුන් නවක වදයට භාජනය කිරීමට හැකි වූයේ කවර අවස්ථාගත කරුණු නිසා ද යන වග ;

(2) එකී ගුරුවරුන් නවක වදයට භාජන කරනු ලැබිය හැකි වූයේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ සේවා නියුක්තියෙහි නිරත යම් තැනැත්තකු හෝ තැනැත්තන් කිසිවකුත් ඔහුගේ හෝ ඔවුන්ගේ කාර්ය නොසලකා හැරීම නිසා ද යන වග සහ එකී නවක වදයට භාජන කිරීම වැලැක්වීමට හෝ නැවැත්වීමට අවශ්‍ය වූ හා එහි ලා කාලෝචිත පියවර ගැනීම යම් තැනැත්තකු හෝ තැනැත්තන් කිසිවකු විසින් පැහැර හරින ලද්දේ ද යන වග ;

(3) යම් තැනැත්තෙක් තමාම කෙළින්ම හෝ අන් අයුරකින් එකී ගුරුවරුන් හෝ එම ඩිප්ලෝමා පාඨමාලාවට සහභාගිවීමට පැමිණි වෙන යම් තැනැත්තකු නවක වදයට භාජන කිරීමෙහි යෙදුනේ ද යන වග ;

(4) එකී නවක වදයට භාජන කිරීමට සම්බන්ධ යම් විනය විරෝධී ක්‍රියාවකට ආධාර වශයෙන් යම් තැනැත්තකු විසින් බලධර වෙන යම් තැනැත්තකු බිය වද්දන ලද්දේ ද ඔහුට පරිභව කරන ලද්දේ ද හෝ තර්ජන කරන ලද්දේ ද යන වග ;

A 1—එ 13539—4,275 (75/04)

(5) ඉහත කී නාවික වදය දීම සඳහා යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් හෝ මණ්ඩපයේ ශිෂ්‍යයන්ගේ අභ්‍යන්තර හෝ බාහිර යම් සංවිධානයක් විසින් අභිප්‍රේරණය කරන ලද්දේ ද පොළඹවන ලද්දේ ද නැතහොත් අනුබල දෙන ලද්දේ ද, එසේ නම්, ඒ සඳහා වගකිය යුතු තැනැත්තා හෝ තැනැත්තන් කවුරුන් ද යන වග සහ ඔවුන් කොපමණ දුරට ඊට වගකිව යුතු ද යන වග ;

විභාග කර වාර්තා කිරීමේ කාර්යය සඳහා සහ

(අ) ඉහත කී නාවික වදය දීම පිළිබඳව වගකිව යුතු යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට විරුද්ධව හෝ ඉහත කී නාවික වදය දීමට පහසු වූයේ යම් තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ ක්‍රියාවක් නිසා ද නැතහොත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ක්‍රියා කිරීම පැහැර හැරීම නිසා ද, ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට විරුද්ධව ගත යුතු විනය ක්‍රියා මාර්ගය හෝ වෙන යම් ක්‍රියා මාර්ගයක් ; සහ

(ආ) අනාගතයේ දී මෙවැනි ස්වභාවයේ සිද්ධි යළිත් ඇතිවීම වැළැක්වීම පිණිස යෙදිය යුතු ප්‍රතිකර්ම

සම්බන්ධයෙන් නිර්දේශ කිරීම සඳහා මෙයින් පත් කරමි.

තවද ඉහත කී කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය යයි ඔබට පෙනී යන සියලුම පරීක්ෂණ පැවැත්වීමට සහ සියලුම විමර්ශන කිරීමට එකී කොමසාරිස් වන ඔබට බලය දී බලය පවරන අතර ඔබේ පරීක්ෂණවල ප්‍රතිඵල සහ ඔබේ නිර්දේශ දැක්වෙන, ඔබේ අත්සන සහිත වාර්තාවක් මෙහි සඳහන් දින සිට දෙමසක කාලසීමාවක් ඇතුළත මා වෙත එවන ලෙස ද මෙයින් ඔබට නියම කරමි.

තවද ඔබේ අභිමතය පරිදි ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු යයි ඔබ විසින් තීරණය කරනු ලබන ඉහත කී කරුණුවලට අදාළ යම් පරීක්ෂණයක යම් කොටසක් වෙතොත්, එය ප්‍රසිද්ධියේ නො පැවැත්විය යුතු යයි මම මෙයින් විධාන කරමි.

තවද, ඔබේ පරීක්ෂණවල හා විමර්ශනවල කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලනු ලබන සියලුම රජයේ නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් ඒ සඳහා නිසි පරිදි දිය හැකි සියලු සහාය දිය යුතු යයි ද, සැපයිය හැකි සියලු තොරතුරු සැපයිය යුතු යයි ද මම මෙයින් නියම කරමි. එමෙන්ම විධාන කරමි.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ එක් දහස් නවසිය හැත්තෑ පහක් වූ අප්‍රේල් මස දෙවන දින වූ මෙදින කොළඹ දී නිකුත් කරන ලදී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. සී. ඩී. විජේසිංහ,
ජනාධිපතිතුමාගේ ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.